සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

**33 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති හිස් ඉඩ මත ලියන්න.**
* අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු, **අදාළ හිස් ඉඩ මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකට ම **සමාන** ලකුණු හිමි වේ.
* **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සඳහන් කරන්න.
* **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය : ..............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අධි ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

1. පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ආයතනයක ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
   (1) නිශ්චිත කාලයක් තුළ සිදු වූ ගනුදෙනු වාර්තා කිරීම.
   (2) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගනුදෙනු සටහන් කිරීම.
   (3) කළමනාකරුවන්ගේ භාවිතය සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම.
   (4) ප්‍රාග්ධන සපයන්නන් සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
   (5) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු සැපයීම. (......)

2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට මාස 12 ක් ඇතුළත දිගුකාලීන ණයවලින් ගෙවිය යුතු කොටස, ජංගම වගකීමක් ලෙස වර්ග කිරීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
   (1) උපචිත (2) සංගතතා (3) අඛණ්ඩ පැවැත්ම
   (4) ගැළපුම් (5) විචක්ෂණ (......)

3. ආයතනයක් සතු යන්ත්‍රයක ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර 10 සිට වසර 8 දක්වා සංශෝධනය කරන ලද අතර, මෙම සංශෝධනය මත ගණනය කළ ක්ෂය ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා ලදී. මෙම හඳුනා ගැනීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
   (1) ප්‍රමාණාත්මක බව (2) ගැළපුම් (3) ඓතිහාසික පිරිවැය
   (4) අනාවරණ (5) [illegible] (......)

* **අංක 4 සිට 6 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2021.03.01 දින සීමිත සංගල පොදු සමාගම පරිපාලන කටයුතු සඳහා භාවිත කිරීමට රු. 500 000 ක කාර්යාල උපකරණයක් ණයට මිල දී ගන්නා ලදී. 2021.03.02 දින සමාගම විසින් මෙම උපකරණය ස්ථාපනය කිරීම සඳහා රු. 20 000 ක් මුදලින් ගෙවන ලදී. මෙම කාර්යාල උපකරණ ණය, සමාන මාසික වාරික 10 කින් ගෙවිය යුතු වේ. 2021.03.31 දින ප්‍රථම වාරිකය වූ රු. 60 000 ක් ගෙවූ අතර, එහි රු. 10 000 ක පොලියක් ද ඇතුළත් විය.

4. 2021.03.31 දිනට මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | වත්කම් (රු.'000) | = | වගකීම් (රු.'000) | + | හිමිකම (රු.'000) |
|---|---|---|---|---|---|
| (1) | + 420 | | + 440 | | - 20 |
| (2) | + 420 | | + 450 | | - 30 |
| (3) | + 440 | | + 440 | | 0 |
| (4) | + 440 | | + 450 | | - 10 |
| (5) | + 460 | | + 470 | | - 10 |

(......)

[දෙවැනි පිටුව බලන්න

- **අංක 22 සහ 23 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සීමිත සමිත් පොදු සමාගමේ 2020.04.01 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා රඳවාගත් ඉපැයුම් පිළිවෙළින් රු. 8 000 000 ක් සහ රු. 2 000 000 ක් විය. එම සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් මුළු ආදායම සහ මුළු වියදම පිළිවෙළින් රු. 3 000 000 ක් සහ රු. 1 800 000 ක් විය. වර්ෂය සඳහා හඳුනාගත් මුළු වියදම තුළ යන්ත්‍ර දේපළ වල ප්‍රත්‍යාගණනය තුළින් ඇති වූ රු. 600 000 ක ඌනතාවයක් ඇතුළත් වේ. 2018.03.31 දින එම යන්ත්‍ර පළමු වරට ප්‍රත්‍යාගණනය තුළින් රු. 400 000 ක අතිරික්තයක් ඇති වී තිබුණි. ප්‍රවර්තන වර්ෂය තුළ රු. 500 000 ක අතුරු ලාභාංශ ගෙවා ඇති අතර, රු. 800 000 ක අවසන් ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.05.01 දින යෝජනා කර ඇත. වර්ෂය තුළ කොටස් ප්‍රාග්ධනයේ වෙනසක් සිදු වී නොමැත.

**22.** 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ මුළු විස්තීර්ණ ආදායම:

| | වර්ෂය සඳහා ලාභය (රු.'000) | මුළු විස්තීර්ණ ආදායම (රු.'000) |
|---|---|---|
| (1) | 800 | 1 200 |
| (2) | 1 200 | 800 |
| (3) | 1 200 | 1 600 |
| (4) | 1 600 | 1 200 |
| (5) | 1 800 | 1 200 |

(......)

**23.** 2021.03.31 දිනට රඳවාගත් ඉපැයුම් සහ හිමිකම:

| | රඳවාගත් ඉපැයුම් (රු.'000) | හිමිකම (රු.'000) |
|---|---|---|
| (1) | 2 300 | 10 300 |
| (2) | 2 700 | 10 700 |
| (3) | 3 100 | 11 100 |
| (4) | 3 300 | 11 300 |
| (5) | 3 600 | 11 100 |

(......)

- **අංක 24 සහ 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2020.04.01 දින සංස්ථාපනය කරන ලද සීමිත බෙල්ටා පොදු සමාගමට පහත තොරතුරු අදාළ වේ.

| **2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **රු.'000** |
|---|---|
| බදු පෙර ලාභය | 1 080 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 80 |
| පොලී වියදම | 160 |
| සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ ලාභාංශ | 300 |
| **2021.03.31 දිනට හිමිකම** | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (කොටසක් රු. 20 බැගින්) | 10 000 |
| රඳවාගත් ඉපැයුම් | 700 |

**24.** සීමිත බෙල්ටා පොදු සමාගමේ කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශය:

| | කොටසක ඉපැයුම් (රු.) | කොටසක ලාභාංශය (රු.) |
|---|---|---|
| (1) | 1.68 | 0.03 |
| (2) | 2.00 | 0.03 |
| (3) | 2.00 | 0.60 |
| (4) | 2.16 | 0.03 |
| (5) | 2.16 | 0.60 |

(......)

**25.** සීමිත බෙල්ටා පොදු සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය:

| | හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (%) | පොලී ආවරණ අනුපාතය (වාර) |
|---|---|---|
| (1) | 9.09 | 6.25 |
| (2) | 9.35 | 6.75 |
| (3) | 9.35 | 7.75 |
| (4) | 10.00 | 6.25 |
| (5) | 10.00 | 7.75 |

(......)

5. 2021.03.31 දින ගෙවන ලද ප්‍රාග්ධන ණය වාරිකය සටහන් කිරීම සඳහා **නිවැරදි** ද්විත්ව සටහන කුමක් ද?

| | ගිණුම | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|---|
| (1) | කාර්යාල උපකරණ ණය | 50 | |
| | මුදල් | | 50 |
| (2) | කාර්යාල උපකරණ ණය | 60 | |
| | මුදල් | | 60 |
| (3) | කාර්යාල උපකරණ ණය | 50 | |
| | කාර්යාල උපකරණ | 10 | |
| | මුදල් | | 60 |
| (4) | කාර්යාල උපකරණ ණය | 50 | |
| | පොලී වියදම | 10 | |
| | මුදල් | | 60 |
| (5) | කාර්යාල උපකරණ ණය | 60 | |
| | පොලී වියදම | 10 | |
| | මුදල් | | 60 |
| | ගෙවිය යුතු පොලී | | 10 |

(......)

6. කාර්යාල උපකරණයෙහි පිරිවැය සටහන් කිරීමට භාවිත කරන මූලික ලියවිල්ල/ලියවිලි සහ මූලික සටහන් පොත/පොත් කවරේ ද?

| | මූලික ලියවිල්ල/ලියවිලි | මූලික සටහන් පොත/පොත් |
|---|---|---|
| (1) | ගැනුම් ඉන්වොයිසිය | ගැනුම් ජර්නලය |
| (2) | ගැනුම් ඉන්වොයිසිය | පොදු ජර්නලය |
| (3) | ජර්නල් වවුචරය | පොදු ජර්නලය |
| (4) | ගැනුම් ඉන්වොයිසිය සහ ගෙවීම් වවුචරය | ගැනුම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය |
| (5) | ජර්නල් වවුචරය සහ ගෙවීම් වවුචරය | පොදු ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය |

(......)

- **අංක 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක් රු. 100 000 ක මුදලින් ආයෝජනය කරමින් 2021.01.01 දින සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ආයතනය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. ගැනුම් සහ විකුණුම් තුළ 8% ක VAT ඇතුළත් වේ. 2021.01.31 දිනෙන් අවසන් මාසය තුළදී පහත ගනුදෙනු සිදු විය.

* රු. 540 000 ක භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී.
* මෙම සියලුම භාණ්ඩ රු. 648 000 කට ණයට විකුණන ලදී.
* ණයගැතියන්ගෙන් රු. 500 000 ක් ලැබුණි.
* රු. 20 000 ක වට්ටමකට යටත්ව රු. 360 000 ක් වූ ණයහිමියන් පියවන ලදී.

7. 2021.01.31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය සහ 2021.01.31 දිනට මුදල් ගිණුමේ ශේෂය කොපමණ ද?

| | දළ ලාභය (රු.'000) | මුදල් ගිණුමේ ශේෂය (රු.'000) |
|---|---|---|
| (1) | 100 | 160 |
| (2) | 100 | 240 |
| (3) | 100 | 260 |
| (4) | 108 | 160 |
| (5) | 108 | 260 |

(......)

8. 2021.01.31 දිනට ව්‍යාපාරයේ මුළු වත්කම් සහ හිමිකම කොපමණ ද?

| | මුළු වත්කම් (රු.'000) | හිමිකම (රු.'000) |
|---|---|---|
| (1) | 180 | 120 |
| (2) | 180 | 220 |
| (3) | 188 | 220 |
| (4) | 188 | 228 |
| (5) | 200 | 228 |

(......)

9. නිමාසි ට්‍රේඩර්ස් තනි පුද්ගල ව්‍යාපාරයකි. සේවක අර්ථසාධක අරමුදලට (EPF) සෙම ආයතනයේ සේවා හා සේවක දායකත්වයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරය ගෙවූ ශුද්ධ වැටුප රු. 1 800 000 ක් වේ. EPF සඳහා සේවක දායකත්වය, දළ වැටුපෙන් කෙළින්ම අඩු කිරීම වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැටුප් වියදම සහ EPF වියදම කොපමණ ද?

| | වැටුප් වියදම (රු.'000) | EPF වියදම (රු.'000) |
|---|---|---|
| (1) | 1 800 | 270 |
| (2) | 1 800 | 300 |
| (3) | 2 000 | 300 |
| (4) | 2 000 | 500 |
| (5) | 2 400 | 360 |

(......)

10. තනි පුද්ගල ව්‍යාපාරයක් වන අරලිය එන්ටර්ප්‍රයිසස් 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළිවෙළින් රු. 765 000 ක සහ රු. 540 000 ක දළ ලාභයක් සහ ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී. වර්ෂය තුළ රු. 65 000 ක තොග හානි වී ඇත. 2021.03.31 දිනට ව්‍යාපාරයේ පැවති භෞතික තොගය මත අවසාන තොගය තක්සේරු කර ඇත. කෙසේ වුව ද, තොග හානි වීම සම්බන්ධව ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොමැත. තොග හානිය ගැළපූ පසු නිවැරදි දළ ලාභය සහ ශුද්ධ ලාභය කොපමණ ද?

| | දළ ලාභය (රු.'000) | ශුද්ධ ලාභය (රු.'000) |
|---|---|---|
| (1) | 700 | 475 |
| (2) | 700 | 540 |
| (3) | 765 | 475 |
| (4) | 830 | 540 |
| (5) | 830 | 605 |

(......)

11. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මිහිරානි මෙනුෆැක්චරර්ස් හි ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| 2020.04.01 දිනට අමුද්‍රව්‍ය තොගය | 100 |
| 2021.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය | 70 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 130 |
| වර්ෂය තුළ භෞතික තොගයේ මැඩි වීම | 15 |
| සෘජු ශ්‍රම පිරිවැය | 70 |
| නිෂ්පාදන ඒකක මත පුරස්කාර ගෙවීම | 30 |
| කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය | 35 |

මූල නිෂ්පාදන පිරිවැය මත පදනම්ව භෞතික තොගය අගය කෙරේ.
2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය සහ මූල නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

| | ප්‍රාථමික පිරිවැය (රු.'000) | මූල නිෂ්පාදන පිරිවැය (රු.'000) |
|---|---|---|
| (1) | 200 | 220 |
| (2) | 200 | 250 |
| (3) | 215 | 250 |
| (4) | 260 | 280 |
| (5) | 260 | 310 |

(......)

12. සුනිසල් ට්‍රේඩර්ස් කිසිදු ආකාරයට ගිණුම් පොත් පවත්වා නොගනී. පහත තොරතුරු 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| 2020.04.01දිනට තොගය | 140 |
| 2021.03.31දිනට තොගය | 170 |
| විකුණුම් | 1 050 |
| භාණ්ඩ පැදුම් | 50 |
| නොහරණේ කුලී | 40 |

සුනිසල් ට්‍රේඩර්ස් විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරනු ලබයි. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනුම් කොපමණ ද?

(1) රු. 840 000 (2) රු. 880 000 (3) රු. 915 000
(4) රු. 920 000 (5) රු. 955 000

(......)

[හතරවැනි පිටුව බලන්න

**13.** 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සරණ සුභසාධක සංගමයට අදාළව පහත තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | රු.'000 |
|---|---|
| 2020.01.01 දිනට ලැබිය යුතු සාමාජික මුදල් | 192 |
| 2020.01.01 දිනට අත්තිකාරම් ලද සාමාජික මුදල් | 60 |
| ප්‍රස්තුත වර්ෂය තුළදී ලද සාමාජික මුදල් | |
| 2019 වර්ෂය සඳහා | 144 |
| 2020 වර්ෂය සඳහා | 1 092 |
| 2021 වර්ෂය සඳහා | 108 |
| 2020.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් | 96 |

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම:

(1) රු. 1 092 000 (2) රු. 1 200 000 (3) රු. 1 308 000
(4) රු. 1 344 000 (5) රු. 1 488 000 (......)

**14.** 1890 හවුල් ව්‍යාපාර පනතේ 24 වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A – හවුල්කරුවන් හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය සඳහා 5% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.

B – හවුල්කරුවන් විශ්‍රාම යන අවස්ථාවේදී ගෙවිය යුතු මුදල පියවා නොමැති විට ඔවුන් ඒ සඳහා 5% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.

C – හවුල්කරුවන් කළමනාකරණය සඳහා දායක වූ විට ඔවුන් වැටුප් සඳහා හිමිකම් ලබයි.

D – හවුල් ව්‍යාපාරයේ වියදමක් හවුල්කරුවන්ගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇති විට, එය ප්‍රතිපූරණය කිරීමට ඔවුන් හිමිකම් ලබයි.

(1) A හා C පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) B, C හා D පමණි. (......)

- **අංක 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

අමල් හා සමන් පිළිවෙළින් 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2020.03.31 දිනට ඔවුන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ.

| | අමල් (රු.'000) | සමන් (රු.'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් ශේෂය | 300 | 200 |
| ජංගම ගිණුම් ශේෂය | 60 | 50 |

හවුල්කරුවන්ට වැටුප් සහ ප්‍රාග්ධන පොලී ගෙවනු නොලැබේ. 2021.03.31 දින නලින් නව හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට ඇතුළු කර ගන්නා ලදී. නලින් ප්‍රාග්ධනය ලෙස රු. 500 000 ක් දායක විය. අමල්, සමන් සහ නලින් අතර නව ලාභාලාභ අනුපාතය පිළිවෙළින් 3 : 2 : 1 ක් වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 150 000 ක් විය. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගලපනු ලැබේ. වර්ෂය තුළ ගැනීම් සිදු කර නොමැත.

2021.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ (කීර්තිනාමය සහ නලින්ගේ ප්‍රාග්ධන දායකත්වය ගැළපීමෙන් පසුව) පහත පරිදි විය.

| හවුල්කරු | අමල් | සමන් | නලින් |
|---|---|---|---|
| ශේෂය (රු.'000) | 330 | 220 | 450 |

**15.** 2021.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ඇස්තමේන්තු කරන ලද කීර්තිනාමය කොපමණ ද?

(1) රු. 50 000 (2) රු. 250 000 (3) රු. 300 000
(4) රු. 500 000 (5) රු. 750 000 (......)

**16.** 2021.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකම සහ අමල්ගේ ජංගම ගිණුමේ ශේෂය කොපමණ ද?

| | හිමිකම (රු.'000) | අමල්ගේ ජංගම ගිණුමේ ශේෂය (රු.'000) |
|---|---|---|
| (1) | 1 000 | 135 |
| (2) | 1 000 | 150 |
| (3) | 1 235 | 135 |
| (4) | 1 260 | 110 |
| (5) | 1 260 | 150 |

(......)

[පස්වැනි පිටුව බලන්න

17. බරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුව ගණනය කරන, ඒකකයක තොග පිරිවැය වෙනස්වීමට පහත කුමන සාධක බලපානු ලබයි ද?

A - ගැනුම් මිල
B - මිලදී ගන්නා ලද ප්‍රමාණය
C - නිකුත් කරන ලද ප්‍රමාණය
D - ආරම්භක තොගයේ පිරිවැය

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (......)

18. සීමිත මධුෂිකා පොදු සමාගම 2016.04.01 දින සංස්ථාපනය කරන ලදී. සමාගම එහි ඉඩම 2019.03.31 දින ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එමගින් රු. 500 000 ක අතිරික්තයක් ඇති විය. 2021.03.31 දින ඉඩම නැවත ප්‍රත්‍යාගණනය කළ අතර, එමගින් රු. 300 000 ක උනතාවක් ඇති විය. තව ද සමාගම එහි යන්ත්‍රෝපකරණ 2021.03.31 දින ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එමගින් රු. 800 000 ක උනතාවක් ඇති විය.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2021.03.31 දින ඇති වූ ප්‍රත්‍යාගණන උනතාවන් සඳහා වන **නිවැරදි** ගිණුම්කරණ පිළිවෙත

(1) රු. 1 100 000 ක් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනීම
(2) රු. 1 100 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම
(3) රු. 300 000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 800 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම
(4) රු. 600 000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 500 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම
(5) රු. 800 000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 300 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම (......)

19. LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව පහත කුමන අවස්ථාවේදී/අවස්ථාවන්හිදී සමාගමක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබන්නේ ද?

A - වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකිණීම
B - දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම
C - විකුණන ලද දෝෂ සහිත භාණ්ඩ අලුත්වැඩියා කිරීමට අතීත පිළිවෙතට අනුව භාර ගැනීම

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

20. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව පහත කුමන අවස්ථාව/අවස්ථා ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් ලෙස සලකනු ලබන්නේ ද?

A - ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීම
B - තොග අගය කිරීමට යොදාගනු ලබන පිරිවැය සූත්‍ර බරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයේ සිට පෙර-ඒම පෙර-පිට (FIFO) ක්‍රමයට වෙනස් කිරීම
C - දේපළ, පිරියත සහ උපකරණ පන්තියක මිනුම් කිරීමේ පදනම, පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස් කිරීම

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

21. සීමිත රෝෂාන් පොදු සමාගම 2020.04.01 දින වසර 4 ක කාලසීමාවක් සඳහා මෝටර් රථයක් කල්බදු ගැනීමට කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. එදින මූලික ගෙවීම ලෙස රු. 1 500 000 ක් ගෙවන ලදී. එදින කල්බදු වගකීමෙහි මූලික මිනුම් කිරීම රු. 3 500 000 ක් විය. කල්බදු ගිවිසුමට අනුව කල්බදු කාලසීමාව අවසානයේදී මෙම වත්කමෙහි හිමිකාරිත්වය සීමිත රෝෂාන් පොදු සමාගමට මාරු කරනු ලැබේ. මෙම මෝටර් රථයේ ඵලදායී ජීව කාලය වසර 5 කි.

SLFRS 16 (කල්බදු) ප්‍රමිතයට අනුව 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ ක්ෂය කොපමණ ද?

(1) රු. 400 000 (2) රු. 700 000 (3) රු. 875 000
(4) රු. 1 000 000 (5) රු. 1 250 000 (......)

[හත්වැනි පිටුව බලන්න.

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු මෙහි ඉඩ මත ලියන්න.

**31.** ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|---|
| A - | ලංකා ගිණුම්කරණ ප්‍රමිති පරිශීලනය යටතේ ලබන සෑම ව්‍යාපාරයක්ම ගිණුම්කරණ ප්‍රමිති පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. | ............ |
| B - | පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන මූලික වශයෙන් ව්‍යාපාරයක අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ තොරතුරු අවශ්‍යතාවන් පිළිබඳව අවධානය යොමුකරමින් පිළියෙල කරනු ලබයි. | ............ |
| C - | ව්‍යාපාරයකට බලපාන පරිසර සාධකවල වෙනස්වීම්වලට අනුකූලව එහි මූල්‍ය වාර්තාවල අන්තර්ගතය වෙනස් විය හැක. | ............ |
| D - | ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියේ ආරම්භක පියවර වන්නේ ගනුදෙනු හඳුනාගැනීමයි. | ............ |

**32.** පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපාරයක පහත ගනුදෙනු හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්නුම් කරන හිමිකම් ශේෂය **වැඩි වේ** ද, **අඩු වේ** ද, **වෙනස් නොවේ** ද යන්න සඳහන් කරන්න.

| | ගනුදෙනුව | හිමිකමට සිදුවන බලපෑම (වැඩි වේ/ අඩු වේ/ වෙනස් නොවේ) |
|---|---|---|
| A - | පොල් ණයට මිල දී ගැනීම | ............ |
| B - | ලාභයක් සහිතව පොල්තෙල් ණයට විකිණීම | ............ |
| C - | වට්ටමකට යටත්ව පොල් සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම | ............ |
| D - | අයිතිකරු විසින් පෞද්ගලික භාවිතය සඳහා පොල්තෙල් ලබා ගැනීම | ............ |

**33.** මධුර සහල් ඇඹරුම්හලෙහි සිදුවූ පහත එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

| | ගනුදෙනුව | මූලික සටහන් පොත |
|---|---|---|
| A - | ගොවීන්ගෙන් අත්පිට මුදලට වී මිල දී ගැනීම | ............ |
| B - | හාල් සැකසීමේ යන්ත්‍රයක් ණයට මිල දී ගැනීම | ............ |
| C - | තොග වෙළෙන්දන්ට සහල් ණයට විකිණීම | ............ |
| D - | සත්ව ආහාර නිෂ්පාදනය කරන්නන්ට කැඩුණු සහල් ණයට විකිණීම | ............ |

**34.** 2021.03.31 දිනට ව්‍යාපාරයක ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 560 000 ක් වූ අතර, එම ශේෂය එදිනට ණයගැති ලෙජරයේ ශේෂවල එකතුවට සමාන නොවී ය. පසුව කරන ලද විමර්ශනයේදී පහත දෑ හෙළිදරව් විය.

- ණයගැති ලෙජරයෙහි බොල් ණය ලෙස කපාහල රු. 20 000 ක ණයගැති ශේෂයක් ණයගැති පාලන ගිණුමට බැරපත් කර නොතිබුණි.
- රු. 42 000 ක විකුණුම් ඉන්වොයිසියක් රු. 24 000 ක් ලෙස විකුණුම් ජර්නලයේ සටහන් වී තිබුණි. මෙසේ වුව ද මෙය නිවැරදිව ණයගැති ලෙජරයේ සටහන් වී තිබුණි.

2021.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

(අ) ඉහත වැරදි **නිවැරදි කිරීමට පෙර** ණයගැති ලෙජරයේ ශේෂවල එකතුව : රු. ............

(ආ) ඉහත වැරදි **නිවැරදි කිරීමෙන් පසු** ණයගැති පාලන ගිණුමේ සංශෝධිත ශේෂය : රු. ............

**26.** පහත සඳහන් ප්‍රකාශය/ප්‍රකාශ පිරිවැය වර්ගීකරණය සම්බන්ධයෙන් **නිවැරදි** වේ ද?

A - සියලුම සෘජු පිරිවැය, විචල්‍ය පිරිවැය වේ

B - සියලුම වක්‍ර පිරිවැය, ස්ථාවර පිරිවැය වේ

C - සියලුම පොදුකාර්ය පිරිවැය, වක්‍ර පිරිවැය වේ

D - සියලුම සෘජු පිරිවැය, නිෂ්පාදන පිරිවැය වේ

(1) A පමණි. (2) C පමණි. (3) A හා B පමණි

(4) C හා D පමණි. (5) B, C හා D පමණි. (......)

**27.** නිෂ්පාදන ව්‍යාපාරයක් විසින් භාවිත කෙරෙන අමුද්‍රව්‍යයක යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය පිළිවෙළින් කිලෝග්‍රෑම් 2 000 ක් සහ කිලෝග්‍රෑම් 5 000 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ සතියක අවම පරිභෝජනය කිලෝග්‍රෑම් 200 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ අවම සහ උපරිම පෙරාත්තු කාලය පිළිවෙළින් සති 3 ක් සහ සති 5 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ උපරිම තොග මට්ටම:

(1) කිලෝග්‍රෑම් 5 000 (2) කිලෝග්‍රෑම් 5 800 (3) කිලෝග්‍රෑම් 6 100

(4) කිලෝග්‍රෑම් 6 400 (5) කිලෝග්‍රෑම් 7 000 (......)

**28.** පිරිවැය ඒකකයක් සඳහා පොදුකාර්ය පිරිවැය සඳහාගැනීමේදී අනුගමනය කරන පියවර පහත දී ඇත. මෙම පියවරයන්හි **නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?

A - පොදුකාර්ය පිරිවැය ප්‍රතිපාදනය කිරීම

B - පොදුකාර්ය පිරිවැය රැස් කිරීම

C - පොදුකාර්ය පිරිවැය අවශෝෂණය කිරීම

D - පොදුකාර්ය පිරිවැය විභාජනය කිරීම

(1) A, B, C, D (2) A, B, D, C (3) B, A, C, D

(4) B, A, D, C (5) C, D, A, B (......)

**29.** සමාගමක සමච්ඡේද ලක්ෂ්‍යය ඒකක 6 000 කි. ඒකකයක විකුණුම් මිල සහ මුළු ස්ථාවර පිරිවැය පිළිවෙළින් රු. 200 ක් සහ රු. 480 000 ක් වේ.

ඒකකයක විචල්‍ය පිරිවැය සහ ඒකක 8 000 ක් විකුණන විට සමාගමේ ලාභය:

| | ඒකකයක විචල්‍ය පිරිවැය (රු.) | ලාභය (රු.) |
|---|---|---|
| (1) | 80 | 160 000 |
| (2) | 80 | 480 000 |
| (3) | 120 | 160 000 |
| (4) | 120 | 240 000 |
| (5) | 120 | 480 000 |

(......)

**30.** සීමිත අවරා පොදු සමාගම නව ව්‍යාපෘතියක් සඳහා යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මෙම නව යන්ත්‍රයේ ගැනුම් මිල රු. 3 000 000 ක් වන අතර, එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 500 000 ක් වේ. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත බදු පසු ලාභය පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| බදු පසු ලාභය (රු.'000) | 250 | 750 | 500 | 1 000 | 1 000 |

මෙම ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය:

(1) වසර 2.5 (2) වසර 3 (3) වසර 4 (4) වසර 4.5 (5) වසර 5 (......)

47. පිරිවැය වර්ගීකරණයට අදාළව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

(අ) තොග අගය කිරීම සඳහා, පිරිවැය, ........................................................................ සහ ........................................................................ ලෙස වර්ග කෙරේ.

(ආ) පිරිවැය, ඒවායේ හැසිරීම මත, ........................................................................ සහ ........................................................................ ලෙස වර්ග කෙරේ.

48. නිෂ්පාදන ව්‍යාපාරයක භාවිත කරන අමුද්‍රව්‍යයක් සඳහා පහත තොරතුරු සපයා ඇත.

- වාර්ෂික ඉල්ලුම — ඒකක 3 200
- අමුද්‍රව්‍ය පිරිවැය — ඒකකයක් සඳහා රු. 800
- ඇණවුම් පිරිවැය — ඇණවුමක් සඳහා රු. 1 000
- වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය — අමුද්‍රව්‍ය පිරිවැයෙන් 20%

පහත දෑ ගණනය කරන්න.

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) : ඒකක ........................................

(ආ) EOQ ඇණවුම් කරන්නේ නම්, වාර්ෂික මුළු ඇණවුම් පිරිවැය: රු. ........................................

49. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන අතර, එහි ඒකකයක දායකය රු. 50 ක් වේ. පහත තොරතුරු එම සමාගමේ ක්‍රියාකාරී මට්ටම් දෙකක් සඳහා අදාළ වේ.

| නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව | ඒකකයක මුළු පිරිවැය (රු.) |
|---|---|
| 4 000 | 100 |
| 6 000 | 80 |

පහත දෑ සඳහන් කරන්න:

(අ) මුළු ස්ථාවර පිරිවැය රු. ........................................

(ආ) ඒකකයක විකුණුම් මිල රු. ........................................

50. කාර්මික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා නව යන්ත්‍රයක් මිල දී ගැනීමට ව්‍යාපාරික සමාගමක් සැලසුම් කරමින් සිටී. මෙම යන්ත්‍රයේ ගැනුම් මිල රු. 5 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය සහ ප්‍රතිලාභ අගය පිළිවෙළින් වසර 8 ක් සහ රු. 700 000 ක් වේ. මෙම ව්‍යාපෘති වාර්තාව සැකසීම සඳහා සමාගම රු. 60 000 ක් ගෙවන ලදී. තව ද මෙම ව්‍යාපෘතිය ආරම්භයේ කාරක ප්‍රාග්ධනය ලෙස රු. 150 000 ක් යෙදවිය යුතු අතර, එය ව්‍යාපෘතිය අවසානයේදී අයකර ගත හැකිය. මෙම ව්‍යාපෘතිය නිසා වාර්ෂික මුදල් ගලායාමවල ඇස්තමේන්තුගත ඉතිරිය රු. 800 000 ක් වේ.

ව්‍යාපෘතිය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු ආරම්භක මුදල් ගලා යෑම : රු. ........................................

(ආ) 8 වන වසරේ මුළු මුදල් ගලා ඒම : රු. ........................................

(ඇ) 1 වන වසරේ වාර්ෂික මෙහෙයුම් ලාභය : රු. ........................................

(ඈ) ගිලුණු පිරිවැය : රු. ........................................

* * *

35. අමල් වෙළඳසැල සකස් කර ඇති ආදායම් ප්‍රකාශනයේ A, B, C සහ D යන අක්ෂරවලින් දක්වා ඇති එක් එක් අයිතමයට අදාළ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

අමල් වෙළඳසැල ← A

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය ← B

රු.'000 ← C

| | | |
|---|---|---|
| විකුණුම් | XXXX | } ← D |
| විකුණුම් පිරිවැය | (XXX) | |
| දළ ලාභය | XXX | |

A .................................... B ....................................

C .................................... D ....................................

36. තනි පුද්ගල ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|
| A - ව්‍යාපාරයේ ලාභය මුදල් ගැනිලි ලෙස බෙදාහැරිය හැක. | .................... |
| B - අයිතිකරුට විකුණන ලද භාණ්ඩ ව්‍යාපාරයේ විකුණුම් ලෙස ගිණුම් ගත කෙරේ. | .................... |
| C - භාණ්ඩ පරිභෝග ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනාගත යුතු ය. | .................... |
| D - මුදල් පදනම මත ගනුදෙනු සටහන් කරන විට ආදායම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. | .................... |

37. තනි පුද්ගල ව්‍යාපාරයක් වන සියාඳි වෙළඳසැල විසින් 'විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම' මත භාණ්ඩ විකුණනු ලබයි. නියෝජිතයාට භාණ්ඩ යැවූ දින සිට දින 30 ක කාලයක් ඇතුළත නොවිකිණී ඇති භාණ්ඩ ආපසු එවිය යුතු වේ. 2021.03.15 වන දින පිරිවැය රු. 500 000 ක් වූ භාණ්ඩ නියෝජිතයෙකුට යවන ලදී. මෙම භාණ්ඩවල විකුණුම් මිල රු. 700 000 කි. 2021.03.31 දින වන විට නියෝජිතයාට විකිණීමට හැකි වූයේ මෙම භාණ්ඩවලින් 60% ක් පමණි. 2021.03.31 දිනට නියෝජිතයා සන්තකයෙහි තිබූ තොගවල ශුද්ධ උපලබ්ධි අගය රු. 210 000 ක් විය.

ඉහත ගනුදෙනුවට අදාළව සියාඳි වෙළඳසැල සඳහා පහත දෑ සඳහන් කරන්න.

(අ) 2021.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් ආදායම : රු. ....................

(ආ) 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කළ තොගයේ අගය : රු. ....................

- **අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

මංජුලා සහ සංජුලා ලාභාලාභ සමානව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2020.04.01 දින අංජුලා හවුල්කරුවකු ලෙස ඇතුළත් කරගන්නා ලද අතර, ඇය ප්‍රාග්ධනය සහ කීර්තිනාම කොටස යන දෙකම සඳහා මුදල් යොදවන ලදී. එදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගලපනු ලබයි. මංජුලා, සංජුලා සහ අංජුලා අතර ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙළින් 5 : 3 : 2 ක් ලෙස වෙනස් විය. අතිරේක තොරතුරු පහත දී ඇත.

| | මංජුලා (රු.'000) | සංජුලා (රු.'000) | අංජුලා (රු.'000) |
|---|---|---|---|
| 2020.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂ, (කීර්තිනාමය ගැළපීමෙන් පසු) | 5 000 | 3 200 | 1 800 |
| **2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | | |
| - ලාභ කොටස් | 1 000 | 600 | 400 |
| - හවුල්කරුවන්ගේ ගැනීම් | 800 | 800 | 600 |

38. මංජුලා, සංජුලා සහ අංජුලා හවුල් ව්‍යාපාරය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) 2020.04.01 දින අංජුලා යොදවන ලද මුදල : රු.'000 ....................

(ආ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය : රු.'000 ....................

[දහවැනි පිටුව බලන්න.

00142

AL/2021(2022)/33/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස්:
* **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

1. සීමිත එරංග පොදු සමාගමේ 2021.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ: | | |
| ඉඩම - පිරිවැයට | 10 000 | |
| ගොඩනැගිලි - පිරිවැයට | 18 000 | |
| කාර්යාල උපකරණ - පිරිවැයට | 7 500 | |
| මෝටර් රථ - ශේෂය | 20 000 | |
| 2021.03.31 දිනට සමුච්චිත ක්ෂයः | | |
| ගොඩනැගිලි | | 3 000 |
| කාර්යාල උපකරණ | | 1 500 |
| මෝටර් රථ | | 6 500 |
| තොගය | 4 250 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 7 400 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 4 250 |
| භාවිත අයිතිය සහිත වත්කම | 2 500 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 500 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 38 000 |
| 2020.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 12 500 |
| විකුණුම් | | 60 000 |
| විකුණුම් පිරිවැය | 38 500 | |
| පරිපාලන වියදම් | 6 800 | |
| බෙදාහැරීමේ පිරිවැය | 7 200 | |
| මූල්‍ය පිරිවැය | 1 200 | |
| වෙනත් වියදම් | 600 | |
| ගෙවූ ආදායම් බදු | 1 900 | |
| 2020.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 600 |
| | 126 350 | 126 350 |

**අතිරේක තොරතුරු:**

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) 2020.06.30 දින රු. 1 200 000 ක පිරිවැයට කාර්යාල උපකරණ මිලට ගෙන ඇති අතර, එය නිවැරදි ව ගිණුම්ගත කර ඇත. මෙය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වර්ෂය තුළදී සිදු කරන ලද එකම මිල දී ගැනීමයි.

(ii) ඉඩම් සහ කාර්යාල උපකරණ ඒවායේ වෙළෙඳපොළ මිලට 2021.03.31 දින ප්‍රථමවරට පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

| | රු.'000 |
|---|---|
| ඉඩම් | 15 000 |
| කාර්යාල උපකරණ | 5 000 |

කෙසේ වුව ද, මෙම ප්‍රත්‍යාගණනයන් සඳහා ගිණුම්කරණ සටහන් තබා නොමැත.

(iii) ප්‍රවර්තන වර්ෂය සඳහා ගොඩනැගිලි සහ කාර්යාල උපකරණ ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කර ඇත.

(iv) 2020.10.01 දින මෝටර් රථයක් රු. 4 000 000 කට විකුණන ලදී. මෙම මෝටර් රථය 2018.10.01 දින රු. 5 000 000 කට මිල දී ගෙන තිබූ අතර, සමාගම විසින් මෝටර් රථ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. මෝටර් රථය විකිණීමෙන් ලද මුදල්, මුදල් ගිණුමට 'හර' කර මෝටර් රථ ගිණුමට 'බැර' කර ඇත. මීට අදාළව වෙනත් කිසිදු ගිණුම් සටහනක් තබා නොමැත. ප්‍රවර්තන වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය, මෝටර් රථ ගිණුමේ ආරම්භක ශේෂය මත සම්පූර්ණ වර්ෂය සඳහා ම ගණනය කර ගිණුම්ගත කර ඇත.

(v) පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ පිරිවැයෙහි සංයුතිය පහත පරිදි වේ.

| **විස්තරය** | **පරිපාලන වියදම් (රු.'000)** | **බෙදාහැරීමේ පිරිවැය (රු.'000)** |
|---|---|---|
| විදුලිය හා ආශ්‍රිත වියදම් | 2 500 | 1 200 |
| අධ්‍යක්ෂ ගාස්තු | 1 200 | — |
| ගොඩනැගිලි ක්ෂය | 900 | — |
| මෝටර් රථ ක්ෂය | — | 4 800 |
| කාර්යාල උපකරණ ක්ෂය | 750 | — |
| ප්‍රචාරණය | — | 800 |
| වෙනත් කාර්යාල වියදම් | 1 450 | — |
| වෙනත් බෙදාහැරීම් පිරිවැය | — | 400 |
| **එකතුව** | **6 800** | **7 200** |

(vi) සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවන ලද අතුරු ලාභාංශ, වෙනත් බෙදාහැරීමේ පිරිවැය ලෙස දක්වා ඇත.

(vii) 2021.03.31 දිනට ගෙවිය යුතු රු. 300 000 ක විගණන ගාස්තු සඳහා කිසිදු සටහනක් තබා නොමැත.

(viii) පිරියතයක භාවිත අයිතිය වසර 5 ක කාලයකට ලබාගැනීම සඳහා 2021.03.31 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. කල්බදු ගිවිසුමට අනුව, 2021.03.31 දින රු. 2 500 000 ක් මූලික ගෙවීම ලෙස ගෙවන ලදී. කල්බදු කාලය තුළදී රු. 971 000 ක් බැගින් වූ වාර්ෂික කල්බදු වාරික පහක් ගෙවිය යුතු අතර, පළමු වාරිකය 2022.03.31 දින ගෙවීමට නියමිත ය. කල්බදු කාලය තුළ ගෙවිය යුතු මුළු පොලිය රු. 1 355 000 ක් වන අතර 2022.03.31 දිනෙන් අවසන් වසර සඳහා පොලිය වන රු. 420 000 ක් ද මෙහි ඇතුළත් වේ. මූලික ගෙවීම පමණක් භාවිත අයිතිය සහිත වත්කම ලෙස හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(ix) ගෙවන ලද ආදායම් බදු තුළ පෙර වර්ෂය සඳහා ගෙවූ රු. 500 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයෙහි ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවූ බදු ද ඇතුළත් වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බදු රු. 200 000 ක් ලෙස් ඇස්තමේන්තු කර ඇත.

(x) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් 2021.05.31 දින අනුමැතිය ලබා දුන් අතර, පහත සිදුවීම් මෙම දිනට පෙර සිදු වී ඇත.

- සමාගමෙහි වෙළෙඳ ණයගැතියකු බුන්වත් වූ බව 2021.05.01 දින උසාවිය විසින් ප්‍රකාශ කරන ලදී. 2021.03.31 දිනට ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති වෙළෙඳ ලැබිය යුතු දෑ ශේෂය තුළ මෙම ණයගැතියාගෙන් ලැබිය යුතු රු. 600 000 ක් ද ඇතුළත් වේ.
- 2021.05.15 දින ඇති වූ ගින්නකින් ධාරණ වටිනාකම රු. 5 000 000 ක් වූ ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන්ම විනාශ විය.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත වගකීම් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

2\. (අ) වෘත්තීය ගිණුම්කරණ පාඨමාලා සඳහා දේශන පැවැත්වීමට 2021.05.01 දින මිතුන් අධ්‍යාපන ආයතනය පිහිටුවන ලදී. මෙම ආයතනයෙහි දේශකවරු තිදෙනෙකු සේවය කරනු ලබයි. සෑම දේශකවරයෙකුම මාසයකට අවම පැය 40 ක් ඉගැන්විය යුතු අතර, වැඩිපුර කරන ලද දේශන පැය සඳහා අතිරේක ගෙවීමක් කරනු ලැබේ.

එක් දේශකවරයෙකුගේ පාරිශ්‍රමිකය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| මාසික ස්ථාවර ගෙවීම (අවම දේශන කාලය සඳහා) | 100 000 |
| වැඩිපුර කරන ලද දේශන කාලය සඳහා ගාස්තුව (පැයකට) | 3 000 |

පහත අතිරේක තොරතුරු ද සපයා ඇත.

(i) කොවිඩ් වසංගතය නිසා දේශන මාර්ගගත ක්‍රමයට පැවැත්වූ අතර සෑම දේශකවරයෙකුටම රු. 5 000 ක තාවකාලික අන්තර්ජාල දීමනාවක් මාසිකව ගෙවන ලදී.

(ii) 2021 මැයි මාසය සඳහා දේශන පැය ගණන සහ වැටුපෙන් සිදුකළ අඩු කිරීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| සේවක අංකය | දේශන පැය | සේවක ණය වාරිකය (රු.) | වැටුප් අත්තිකාරම (රු.) |
|---|---|---|---|
| 001 | 50 | 40 000 | – |
| 002 | 70 | – | 25 000 |
| 003 | 40 | 60 000 | – |

(iii) සේවක අංක 003 දරන දේශකවරයා මෙම ආයතනයේ කළමනාකරු ලෙස ද සේවය කරන අතර, ඔහුට ඒ සඳහා මසකට රු. 50 000 ක අතිරේක ස්ථාවර ගෙවීමක් සිදු කරනු ලබයි.

(iv) සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය සහ සේවක දායකත්වය පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍ය දායකත්වය 3% ක් වේ. මාර්ගගත ක්‍රමයට වැඩ කිරීම වෙනුවෙන් ගෙවන ලද තාවකාලික අන්තර්ජාල දීමනාව හැර අනිකුත් සියලු ගෙවීම, EPF සහ ETF ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබයි.

**අවශ්‍යවන්නේ:**

(1) 2021 මැයි මාසය සඳහා වැටුප් ලේඛනය

(2) 2021 මැයි මාසය සඳහා වැටුප් පාලන ගිණුම (ලකුණු 16 යි)

(ආ) සිහින සමාධි පොදු සමාගම 'අඹ' සහ 'දොඩම්' යන පළතුරු යුෂ වර්ග දෙක නිෂ්පාදනය කරනු ලබයි. 'සැකසුම්' සහ 'බෝතල් කිරීම්' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් සමන්විත කර්මාන්ත ශාලාවක් සහ 'ගබඩාව' නම් වූ සේවා දෙපාර්තමේන්තුවක් මෙම සමාගම සතු වේ. මෙම සියලු දෙපාර්තමේන්තු එකම පරිශ්‍රය තුළ පිහිටුවා ඇත. උපරිම ක්‍රියාකාරී මට්ටමේදී ඊළඟ වර්ෂය සඳහා අයවැයගත පොදුකාර්ය පිරිවැය පහත පරිදි වේ.

| විස්තරය | එකතුව (රු.) | සැකසුම් දෙපාර්තමේන්තුව (රු.) | බෝතල් කිරීම් දෙපාර්තමේන්තුව (රු.) | ගබඩාව (රු.) |
|---|---|---|---|---|
| නිෂ්පාදන කළමනාකරුවන්ගේ වැටුප් | 710 000 | 384 000 | 326 000 | – |
| ගබඩා පාලකගේ වැටුප | 300 000 | – | – | 300 000 |
| වක්‍ර වැටුප් | 1 200 000 | ? | ? | ? |
| විදුලි ගාස්තු | 240 000 | ? | ? | ? |
| කුලිය | 480 000 | ? | ? | ? |
| යන්ත්‍ර ක්ෂය (සරල මාර්ග ක්‍රමය පදනම්ව) | 120 000 | ? | ? | – |

[හතරවැනි පිටුව බලන්න

**අතිරේක තොරතුරු:**

(i) පොදුකාර්ය පිරිවැය විභජන පදනම් සහ වෙනත් අදාළ තොරතුරු පහත පරිදි වේ:

| විස්තරය | සැකසුම් දෙපාර්තමේන්තුව | බෝතල් කිරීම් දෙපාර්තමේන්තුව | ගබඩාව |
|---|---|---|---|
| | 30 000 | 10 000 | 8 000 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 4 000 | 3 000 | 1 000 |
| කිලෝවොට් පැය | 60 | 50 | 10 |
| සේවක සංඛ්‍යාව | 1 500 000 | 500 000 | – |
| යන්ත්‍ර - පිරිවැය (රු.) | 60 000 | 30 000 | – |
| අයවැයගත යන්ත්‍ර පැය ගණන (වාර්ෂික) | 20 000 | 50 000 | – |
| අයවැයගත සෘජු ශ්‍රම පැය ගණන (වාර්ෂික) | | | |

(ii) ගබඩාවේ මුළු පොදුකාර්ය පිරිවැය, සැකසුම් සහ බෝතල් කිරීම් දෙපාර්තමේන්තු අතර පිළිවෙළින් 3 : 2 අනුපාතයට නැවත විභජනය කරනු ලැබේ.

(iii) සැකසුම් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මත ද බෝතල් කිරීම් දෙපාර්තමේන්තුව සෘජු ශ්‍රම පැය මත ද පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.

(iv) පහත තොරතුරු සමාගම විසින් නිෂ්පාදනය කරන භාණ්ඩ දෙකට අදාළ වේ.

| | බෝතලයක් සඳහා: අඹ යුෂ | දොඩම් යුෂ |
|---|---|---|
| සත්‍ය යන්ත්‍ර පැය: | | |
| සැකසුම් දෙපාර්තමේන්තුව (පැය) | 2 | 3 |
| බෝතල් කිරීම් දෙපාර්තමේන්තුව (පැය) | 2 | 4 |
| සත්‍ය සෘජු ශ්‍රම පැය: | | |
| සැකසුම් දෙපාර්තමේන්තුව (පැය) | 2 | 3 |
| බෝතල් කිරීම් දෙපාර්තමේන්තුව (පැය) | 3 | 5 |
| සෘජු ශ්‍රම පිරිවැය (රු.) | 50 | 60 |
| සෘජු අමුද්‍රව්‍ය පිරිවැය (රු.) | 115 | 70 |

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) සැකසුම් සහ බෝතල් කිරීම් දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) 'අඹ යුෂ' බෝතලයක සහ 'දොඩම් යුෂ' බෝතලයක මුළු පිරිවැය (වෙන් වෙන් ව)

(4) විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් පවත්වා ගන්නේ නම්, 'අඹ යුෂ' බෝතලයක විකුණුම් මිල

**(ලකුණු 24 යි)**

**(මුළු ලකුණු 40 යි)**

3. 2021.04.01 දින ලිපිද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා කලණි එන්ටර්ප්‍රයිසස් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2021 අප්‍රේල් මාසය තුළදී පහත ගනුදෙනු මෙම ව්‍යාපාරය තුළ සිදු විය.

1. ව්‍යාපාරයේ අයිතිකරු වූ කලණි රු. 500 000 ක් මුදලින් ආයෝජනය කළ අතර, මෙම මුදල තැන්පත් කර බැංකු ජංගම ගිණුමක් ආරම්භ කරන ලදී. තව ද ඇය විසින් රු. 750 000 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක් ආරම්භක ප්‍රාග්ධනයේ කොටසක් ලෙස සපයන ලදී. (මෙම ආයතනයේ සියලුම මුදල් ගනුදෙනු බැංකු ගිණුම තුළින් සිදු වේ.)
2. පිරිවැය රු. 200 000 ක් වූ ලිපිද්‍රව්‍ය ණයට මිල දී ගන්නා ලදී.
3. අඩු ගුණාත්මකභාවය හේතුවෙන් රු. 40 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය, සැපයුම්කරුට ආපසු යවන ලදී.
4. පිරිවැය රු. 60 000 ක් වූ ලිපිද්‍රව්‍ය රු. 100 000 කට ණයට විකුණන ලදී.
5. රු. 10 000 කට විකුණන ලද ලිපිද්‍රව්‍ය ගනුදෙනුකරුවෙකු විසින් ආපසු එවන ලදී. මෙම ලිපිද්‍රව්‍යවල පිරිවැය රු. 6 000 ක් විය.
6. ලිපිද්‍රව්‍ය සැපයුම්කරුට ගෙවිය යුතු රු. 160 000 ක මුදල, 5% ක වට්ටමකට යටත්ව පියවන ලදී.
7. පිරිවැය රු. 3 000 ක් වූ ලිපිද්‍රව්‍ය පෙර පාසලකට පරිත්‍යාග කරන ලදී.
8. රු. 1 000 ක වට්ටමක් ලබා දීමෙන් පසුව රු. 9 000 ක චෙක්පතක් ණයගැතියෙකුගෙන් ලැබුණි.
9. අප්‍රේල් මාසය සඳහා ගෙවිය යුතු විදුලි බිල රු. 7 000 ක් විය.
10. ඡායා පිටපත් යන්ත්‍රයේ මාසික නඩත්තු වියදම ලෙස රු. 5 000 ක් ගෙවන ලදී.
11. මාසය තුළදී ඡායා පිටපත් 5 000 ක් ලබාගත් අතර, ඒවා අත්පිට මුදලට විකුණන ලදී. පිටපතක විකුණුම් මිල සහ ලිපිද්‍රව්‍ය පිරිවැය පිළිවෙළින් රු. 7 ක් සහ රු. 4 ක් විය.
12. ඡායා පිටපත් යන්ත්‍රයේ අප්‍රේල් මාසය සඳහා ක්ෂය රු. 15 000 කි.

[පස්වැනි පිටුව බලන්න.

පහත අතිරේක තොරතුරු 2021.05.05 දින ලද බැංකු ප්‍රකාශනයෙන් ලබා ගන්නා ලදී. 2021.04.30 දිනට ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කිරීමේදී මෙම තොරතුරු සැලකිල්ලට ගෙන නොමැත.

(i) ඡායා පිටපත් යන්ත්‍රයේ නඩත්තු වියදම සඳහා නිකුත් කළ රු. 5 000 ක් වූ චෙක්පත බැංකුවට ඉදිරිපත් කර නොමැත.

(ii) අප්‍රේල් මාසය සඳහා බැංකු ගාස්තු රු. 1 000 ක් වේ.

(iii) අයිතිකරුගේ දියණියගේ මාසික පාසල් ගාස්තු සඳහා රු. 5 000 ක් ස්ථාවර නියෝග අනුව ගෙවා ඇත.

(iv) ගනුදෙනුකරුවෙකු විසින් රු. 20 000 ක් බැංකුවේ සෘජුව තැන්පත් කර ඇත.

**අවශ්‍යවන්නේ:**

(1) අංක 1 සිට 12 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් වටිනාකම ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (−) ද යන්න සඳහන් කරන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | වෙළෙඳ ගෙවිය යුතු දෑ | උපචිත වියදම් | |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| . | | | | | | | |
| . | | | | | | | |
| . | | | | | | | |
| 12 | | | | | | | |
| ශේෂය | | | | | | | |

(2) 2021.04.30 දිනට මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය

(3) 2021 අප්‍රේල් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

(4) 2021.04.30 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

**(මුළු ලකුණු 40 යි)**

**4.** **(අ)** සීමිත ගමගේ පොදු සමාගම දේශීය වෙළෙඳපොළට ඉලෙක්ට්‍රොනික් අයිතම නිෂ්පාදනය කිරීම සඳහා ඉහළ ක්‍රියාකාරිත්වයක් සහිත යන්ත්‍රයක් අත්පත් කරගැනීමට සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ ඇස්තමේන්තුගත මිල රු. 6 500 000 ක් වේ. තව ද මෙම යන්ත්‍රයේ ප්‍රවාහන පිරිවැය සහ ස්ථාපනය කිරීමේ පිරිවැය පිළිවෙළින් රු. 50 000 ක් සහ රු. 200 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. යන්ත්‍රයෙහි ඵලදායී ජීව කාලය වසර 6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතිය ආරම්භයේ දී කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු. 550 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය ව්‍යාපෘතියේ අවසාන වර්ෂයේදී අයකර ගත හැකි ය. ව්‍යාපෘතිය අවසානයේ මෙම යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 750 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ව්‍යාපෘතියේ අපේක්ෂිත බදු පසු වාර්ෂික ලාභය සහ 12% ක් වූ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතයෙහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වසර | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| බදු පසු වාර්ෂික ලාභය (රු.'000) | 550 | 800 | 950 | 1 250 | 1 050 | 750 |
| 12% වට්ටම් සාධකය (ආසන්නතම දශම ස්ථාන දෙකකට) | 0.89 | 0.79 | 0.71 | 0.64 | 0.57 | 0.51 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියේ මූලික මුදල් ගලා යෑම

(2) ව්‍යාපෘතියේ එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම

(3) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)

(4) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ව්‍යාපෘතියේ ආයෝජනය කිරීම සඳහා නිර්දේශය

**(ලකුණු 10 යි)**

[හයවැනි පිටුව බලන්

(ආ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සීමිත සමාගම (පෞද්ගලික) සමාගම එළවළු වෙළෙඳාමේ නිරතව සිටයි. මෙම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත.

2021.01.01 දිනට පහත ශේෂ, ලෙජරයෙන් උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| මුදල් | 100 |
| වෙළෙඳ ණයගැතියෝ | 150 |
| වෙළෙඳ ණයහිමියෝ | 250 |
| VAT පාලන ගිණුම (බැර) | 20 |

ඉහත වෙළෙඳ ණයගැති ශේෂය පියවීම සඳහා 2021.01.20 දින මුදල් ලැබුණි. 2021.01.31 දින සමාගම විසින් ඉහත ගෙවිය යුතු වෙළෙඳ ණයහිමි හා VAT ශේෂ පියවන ලදී.

පහත තොරතුරු 2021 ජනවාරි මාසය සඳහා අදාළ වේ.

**විකුණුම් සහ වෙළෙඳ ණයගැතියෝ :**

සමාගම මැනිං වෙළෙඳපොළේ තොග වෙළෙඳුන් සඳහා දින 30 ක ණය කාල සීමාවක් සහිතව එළවළු ණයට විකුණනු ලබයි. මුළු මුදල දින 15 ක් තුළ පියවන්නේ නම්, VAT රහිත විකුණුම් වටිනාකම මත 10% ක වට්ටමක් දෙනු ලබයි.

2021.01.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් ජර්නලයෙන් උපුටා ගන්නා ලද තොරතුරු:

| | විකුණුම් (රු.'000) | VAT 8% (රු.'000) |
|---|---|---|
| කසුන් | 600 | 48 |
| අමිල | 400 | 32 |
| ප්‍රභාත් | 800 | 64 |
| එකතුව | 1 800 | 144 |

කසුන් සහ අමිල යන දෙදෙනාම මුළු මුදල දින 15 ක කාල සීමාව තුළ පියවන ලදී. කෙසේ වුව ද ප්‍රභාත් විසින් රු. 600 000 ක් පමණක් ගෙවන ලදී.

මෙම සමාගම සතුව එළවළු අලෙවිසැලක්ද නුවරඑළියේ ඇති අතර, එහි සියලුම විකුණුම්, තොග වෙළෙඳුන්ට අත්පිට මුදලට සිදු කෙරේ.

මාසය සඳහා අත්පිට විකුණුම් 8% ක් වූ VAT සහිතව රු. 324 000 ක් විය.

**ගැනුම් සහ වෙළෙඳ ණයහිමියෝ :**

සමාගම සුළු පරිමාණ ගොවීන්ගෙන් අත්පිට මුදලටත් මහා පරිමාණ එළවළු සැපයුම්කරුවෙකු වන නාදන් ට්‍රේඩර්ස් වෙතින් ණය පදනමටත් එළවළු මිල දී ගනු ලබයි.

මාසය තුළදී නාදන් ට්‍රේඩර්ස් වෙතින් ණයට ගැනුම් 8% ක් වූ VAT සහිතව රු. 756 000 ක් විය.

නාදන් සමාගමට ගෙවිය යුතු රු. 605 000 ක ශේෂයක් පියවීම සඳහා රු. 5 000 ක වට්ටමකට යටත්ව රු. 600 000 ක් ගෙවන ලදී.

සුළු පරිමාණ ගොවීන්ගෙන් කළ අත්පිට ගැනුම් රු. 500 000 ක් විය. මෙම ගැනුම් සඳහා VAT අදාළ නොවේ.

**වියදම් සහ අමතර ආදායම් :**

මාසය තුළදී ගෙවන ලද මෙහෙයුම් වියදම් රු. 198 000 ක් විය.

එළවළු මැනිං වෙළෙඳපොළට ප්‍රවාහනය කිරීම සඳහා රු. 54 000 ක මුදලක් තොග වෙළෙඳුන්ගෙන් සමාගම ලබා ගෙන ඇත.

මෙහෙයුම් වියදම් සහ වෙනත් ආදායම් සඳහා VAT අදාළ නොවේ.

**කෙටුම්පත් ලාභය :**

2021.01.31 දිනෙන් අවසන් මාසය සඳහා කෙටුම්පත් ලාභය රු. 856 000 ක් විය. පසුව කරන ලද විමර්ශනයකදී පහත වැරදි හෙළිදරව් විය.

- ලද වට්ටම් සහ දුන් වට්ටම් ගිණුම් ශේෂ ලාභය ගණනය කිරීමේදී මගහැරී ඇත.
- ගෙවූ මෙහෙයුම් වියදම් නිවැරදිව මුදල් ගෙවීම් ජර්නලයේ වාර්තා කර තිබුණත් එය රු. 98 000 ක් ලෙස මෙහෙයුම් වියදම් ගිණුමට පිටපත් කර ඇත.

**අවශ්‍යවන්නේ:**

(1) 2021.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත් සහ ලෙජර ගිණුම්:

(i) මුදල් ලැබීම් ජර්නලය

(ii) මුදල් ගෙවීම් ජර්නලය

(iii) මුදල් ගිණුම

(iv) ණයගැති පාලන ගිණුම

(v) VAT පාලන ගිණුම

(2) වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් (සංලක්ෂණය සහිතව)

(3) 2021.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලාභය නිවැරදි කිරීම සඳහා ප්‍රකාශනය

(ලකුණු 30 යි)

(මුළු ලකුණු 40 යි)

5. (අ) ලාල්, රවි සහ පියල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි කොන්දේසි පහත පරිදි විය.

- ලාල්, රවි සහ පියල් පිළිවෙළින් 5:3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනී.
- සෑම හවුල්කරුවකුම රු. 50 000 ක මාසික වේතනයකට හිමිකම් ලබයි.
- සෑම හවුල්කරුවකුම වර්ෂයේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- කීර්තිනාමය සම්බන්ධ සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදුකළ යුතු වේ.

2021.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙහි ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ (ධාරණ වටිනාකම) | 14 250 | |
| ආයෝජන | 1 200 | |
| විකුණුම් | | 12 000 |
| විකුණුම් පිරිවැය | 4 000 | |
| මෙහෙයුම් වියදම් (ක්ෂයවීම් ඇතුළුව) | 3 500 | |
| මුදල් | 380 | |
| 2021.03.31 දිනට තොගය | 1 500 | |
| වෙළෙඳ ණයහිමියෝ | | 1 700 |
| 2020.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| ලාල් | | 4 000 |
| රවි | | 3 000 |
| පියල් | | 2 000 |
| 2020.04.01 දිනට ජංගම ගිණුම්: | | |
| ලාල් | | 100 |
| රවි | | 90 |
| පියල් | 60 | |
| ණය ගිණුම - ලාල් | | 2 000 |
| | 24 890 | 24 890 |

**අතිරේක තොරතුරු:**

(i) වර්ෂය තුළදී හවුල්කරුවන් විසින් ලබාගත් වේතන සහ භාණ්ඩ ගැනිලි පහත පරිදි වේ.

| හවුල්කරු | ලද වේතන (රු.'000) | භාණ්ඩ ගැනිලි - පිරිවැයට (රු.'000) |
|---|---|---|
| ලාල් | 500 | 80 |
| රවි | 400 | 20 |
| පියල් | 300 | – |

හවුල්කරුවන්ට ගෙවූ වේතන මෙහෙයුම් වියදම් තුළ සටහන් කර ඇත. භාණ්ඩ ගැනිලි ගිණුම් පොත්වල සටහන් කර නොමැත. භෞතික ගණනය මත පදනම් ව 2021.03.31 දිනට තොගයේ පිරිවැය තීරණය කර ඇත.

(ii) ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති ණය මුදල ලාල් විසින් 2020.04.01 දින ලබා දෙන ලදී. මෙම ණය මුදල සඳහා පොලී ගෙවා හෝ ගිණුම්ගත කර නොමැත.

(iii) වර්ෂය තුළ දී රවි විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් හවුල් ව්‍යාපාරයේ වෙළෙඳ ණයහිමියෙකුට රු. 20 000 ක් ගෙවා ඇති නමුත් මෙය ගිණුම් පොත් වල සටහන් කර නොමැත.

(iv) 2021.03.31 දින රවි හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ලාල් සහ පියල් පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යෑමට එකඟ විය.

(v) රවිට ගෙවිය යුතු මුදල පහත පරිදි පියවීමට එකඟ විය.

- ආයෝජනවල අයිතිය පවරා දීම
- කාර්යාල උපකරණයක් එහි ධාරණ වටිනාකම වූ රු. 300 000 කට ලබා දීම
- ඉතිරිය ගෙවිය යුතු ණයක් ලෙස සැලකීම

ඉහත ගැළපීම්, රවිගේ ප්‍රාග්ධන ගිණුම තුළින් සිදුකළ යුතු ය.

/අටවැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

(1) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ආදායම් ප්‍රකාශනය
(හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුළත්ව)

(2) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

(3) 2021.03.31 දිනට රවීට ගෙවිය යුතු ණය මුදල

**(ලකුණු 20 යි)**

(ආ) පහත තොරතුරු සීමිත සාරංග පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගෙන ඇත.

| **2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | **රු.'000** |
|---|---|
| විකුණුම් | 25 000 |
| විකුණුම් පිරිවැය | 15 000 |
| වෙනත් ආදායම් | 1 200 |
| මෙහෙයුම් වියදම් | 4 500 |
| මූල්‍ය වියදම් | 1 500 |
| බදු පෙර ලාභය | 5 200 |
| ආදායම් බදු වියදම් | 1 000 |

| **වත්කම් සහ වගකීම් කිහිපයක ශේෂ:** | **2021.03.31 දිනට (රු.'000)** | **2020.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| තොග | 2 400 | 1 800 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 5 200 | 6 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 3 500 | 4 250 |
| කලින් ගෙවූ මෙහෙයුම් වියදම් | 500 | 200 |
| උපචිත පොලී වියදම් | 400 | 650 |
| ගෙවිය යුතු ආදායම් බදු | 300 | 450 |
| වසර 5 ක ස්ථාවර තැන්පතුව මත ලැබිය යුතු පොලිය | 400 | – |

**අතිරේක තොරතුරු:**

(i) සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

(ii) මූල්‍ය වියදම් සම්පූර්ණයෙන්ම පොලී වියදම්වලින් සමන්විත වන අතර, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ වේ.

(iii) මෙහෙයුම් වියදම් තුළ රු. 1 800 000 ක් වන ක්ෂය අඩංගු වේ.

(iv) වෙනත් ආදායම් පහත අයිතමවලින් සමන්විත වේ.

- මෝටර් රථ විකිණීම මත ලාභය රු. 800 000
- වසර 5 ක ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය රු. 400 000

**අවශ්‍යවන්නේ:**

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ පහත එක් එක් ක්‍රමයට අනුව:

(1) සෘජු ක්‍රමය

(2) වක්‍ර ක්‍රමය

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

(ඉ) 2020.01.01 දිනට BRS ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 165 ක් විය. සාමාජිකයෙකු සඳහා වාර්ෂික සාමාජික මුදල රු. 6 000 කි.

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

- ප්‍රවර්තන වර්ෂය තුළදී නව සාමාජිකයන් 25 ක් ඇතුළත් කරගන්නා ලද අතර, ඔවුන් විසින් වර්ෂ දෙකක් සඳහා වාර්ෂික සාමාජික මුදල් එකවර ගෙවන ලදී.
- 2020.01.01 දිනට සාමාජිකයන් 15 දෙනෙකුගෙන් වාර්ෂික සාමාජික මුදල් ලැබිය යුතුව තිබුණි. මෙම සාමාජිකයන් අතුරෙන් 10 දෙනෙකු පෙර වර්ෂයේ හිඟ සාමාජික මුදල් සහ ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල්, 2020.12.31 දින වන විට නොගෙවීම නිසා ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කරන ලදී. ඉතිරි සාමාජිකයන් 5 දෙනා හිඟ සාමාජික මුදල් සහ ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවන ලදී.
- සාමාජිකයන් 12 දෙනෙකු ප්‍රවර්තන වර්ෂයේ සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

පහත තොරතුරු 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ ලැබීම් සහ ගෙවීම් ගිණුමෙන් උපුටා ගන්නා ලදී.

| ලැබීම් | රු.'000 | ගෙවීම් | රු.'000 |
|---|---|---|---|
| ලද සාමාජික මුදල් | ? | ක්‍රීඩා පුහුණුකරුවන්ගේ දීමනා | 1 150 |
| ලද පරිත්‍යාග | 1 200 | ක්‍රීඩා උපකරණ මිල දී ගැනුම් | 400 |
| ක්‍රීඩා තරගවලින් ලද ආදායම | 790 | කාර්යාල වියදම් | 550 |

ක්‍රීඩා සමාජයේ වත්කම් සහ වගකීම් කිහිපයක් පහත පරිදි විය.

| විස්තරය | 2020.12.31 දිනට (රු.'000) | 2019.12.31 දිනට (රු.'000) |
|---|---|---|
| ක්‍රීඩාංගණය .............................................. | 5 500 | 5 500 |
| ක්‍රීඩා උපකරණ (ධාරණ වටිනාකම) ............ | 1 600 | 1 500 |
| ගෙවිය යුතු කාර්යාල වියදම් ...................... | 70 | 100 |
| ලැබිය යුතු සාමාජික මුදල් ......................... | ? | 90 |
| කලින් ලද සාමාජික මුදල් .......................... | ? | — |

**අතිරේක තොරතුරු:**

පරිත්‍යාග ලද වසරේ සිට ආරම්භ වී වසර 5 ක කාලයක් තුළදී ආදායම් ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

**අවශ්‍යවන්නේ:**

(1) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම

(2) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *

6. (අ) පාසලක සංවර්ධන සමිතියක් විසින් අරමුදල් සම්පාදනය කිරීම සඳහා සය සාමාජික ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීමට තීරණය කර ඇත. තරඟාවලියේ අපේක්ෂිත ආදායම සහ පිරිවැය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| කණ්ඩායමකින් අයකරන ඇතුළත්වීමේ ගාස්තුව | 10 000 |
| කණ්ඩායමක් සඳහා ආහාරපාන පිරිවැය | 4 000 |
| විනිසුරුවන් සඳහා ගාස්තුව | 15 000 |
| කුසලාන සහ සහතිකවල පිරිවැය | 50 000 |
| ක්‍රීඩා උපකරණ කුලියට ගැනීමේ ගාස්තුව | 25 000 |
| සංගීත කණ්ඩායම සඳහා ගාස්තුව | 8 000 |
| සංවිධායක මණ්ඩලය සඳහා ආහාර පාන පිරිවැය | 12 000 |
| කණ්ඩායමක් සඳහා සනීපාරක්ෂක කට්ටලයක පිරිවැය | 1 000 |

අවම වශයෙන් කණ්ඩායම් 35 ක් තරඟාවලියට සහභාගි වන්නේ නම්, රු. 60 000 ක අනුග්‍රාහකත්වයක් ලබා දීමට පාසලෙහි ආදි ශිෂ්‍ය සංගමය එකඟ වී ඇත.

**අවශ්‍යවන්නේ:**

තරඟාවලිය සඳහා පහත දෑ:

(1) කණ්ඩායමක් සඳහා විචල්‍ය පිරිවැය
(2) තරඟාවලියේ මුළු ස්ථාවර පිරිවැය
(3) කණ්ඩායමක දායකය
(4) තරඟාවලියේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍ය වන කණ්ඩායම් ගණන
(5) රු. 40 000 ක අතිරික්තයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන කණ්ඩායම් ගණන
(6) කණ්ඩායම් 35 ක් සහභාගි වන්නේ නම් තරඟාවලියෙන් අපේක්ෂිත අතිරික්තය **(ලකුණු 20 යි)**

(ආ) පහත තොරතුරු සීමිත නිමාලි පොදු සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| **2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | |
| දළ ලාභය | 30 000 |
| මෙහෙයුම් වියදම් | 12 000 |
| පොලී වියදම් | 6 000 |
| බදු වියදම් | 3 000 |
| **2021.03.31 දිනට:** | |
| තොගය | 21 500 |
| ණයගැතියෝ | 17 500 |
| කලින් ගෙවූ වියදම් | 7 500 |
| මුදල් | 11 500 |
| දිගුකාලීන ණය | 54 000 |
| ජංගම වගකීම් | 29 000 |

**අතිරේක තොරතුරු:**

(i) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ අනුපාතය 25% ක් වූ අතර, 2021.03.31 දිනට ජංගම අනුපාතය 2:1 ක් විය.
(ii) 2020.03.31 දිනට තොගය රු. 18 500 000 ක් විය.
(iii) සියලුම විකුණුම් ණය පදනම මත සිදු කරන අතර, 2020.03.31 දිනට ණයගැති ශේෂය රු. 22 500 000 ක් විය.
(iv) 2020.03.31 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය සහ සංචිත රු. 81 000 000 ක් විය.
(v) වසර අග හිමිකම් ශේෂය වෙනස්වීමට බලපෑ එකම අයිතමය වන්නේ වර්ෂයේ ලාභය පමණි.
(vi) වර්ෂයකට වැඩ කරන දින ගණන 360 ක් ලෙස උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ:**

(1) ශුද්ධ ලාභ අනුපාතය
(2) ක්ෂණික වත්කම් අනුපාතය
(3) ණය එකතු කිරීමේ කාලය
(4) තොග පිරිවැටුම් අනුපාතය
(5) ණය හිමිකම් අනුපාතය

**(ලකුණු 10 යි)**

[දහවැනි පිටුව බලන්න.